# ශ්‍රී ලංකාවෙන් හමුවන හස් එබූ කාසි වර්ග පිළිබඳ විමසුමක්: මීරිගම සංචිතය ඇසුරිනි


කේ. ඩබ්. සී. තරංගනී

සහය කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය
k.w.c.tharangani@gmail.com


## හැඳින්වීම


ශ්‍රී ලංකාවෙන් හමුවන පැරණි ම කාසි විශේෂය හස් එබූ කාසි බව පිළිගත් මතය වේ (Codrington 1924:16). මෙම කාසි විශේෂය ක්‍රි.පූ. 3 වැනි සියවසේ අවසාන කාර්තුවේ සිට ක්‍රි.ව. 5 වැනි සියවස දක්වා ශ්‍රී ලංකාව තුළ සංසරණය වී තිබේ (Coningham and Batt 1999:128). ඉන්දියාවෙන් හමුවන පැරණි ම කාසි විශේෂය වන්නේ ද හස් එබූ කාසි බව පිළිගත් මතය වේ (Brown 1922:15). එය ක්‍රි.පූ. 6 වැනි සියවසේ සිට ක්‍රි.ව. 4 වැනි සියවස දක්වා කාලය තුළ සංසරණය වී තිබේ (ජේම්ස් කෙනඩි උපුටා දක්වමින් Bandarkar 1921:39). ලංකාවෙන් හමුවන හස් එබූ කාසි, ඉන්දීය සම්භවයකින් යුත් කාසි ලෙසට විද්වත්හු මත පළ කරති (Codrington 1924:16). ඉන්දියාවෙන් හමු වන හස් එබූ කාසි, ඒවායෙහි හඳුනා ගැනීමට ලැබෙන විශේෂ ලක්ෂණ අනුව වර්ග කිරීමකට ලක් කර තිබේ (Gupta and Hardakar 1985:8-9). මෙම අධ්‍යයනයේ දී සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ මීරිගමින් හමු වූ හස් එබූ කාසි සංචිතයෙහි අඩංගු කාසි වර්ග (coin types) පිළිබඳ ව විමසා බැලීමකි.


## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙහි ක්‍රමවේදය වන්නේ පී.එල්. ගුප්තා සහ ටී.ආර්. හර්දකාර් යන දෙ දෙනා විසින් ඉදිරිපත් කර ඇති වර්ගීකරණය අනුගමනය කරමින් ශ්‍රී ලංකාවේ මීරිගමින් හමු වී ඇති හස් එබූ කාසි සංචිතයේ ඇති කාසිවල වර්ග හඳුනා ගැනීම ය (Gupta and Hardakar 1985:33). මේ සඳහා මූලික පදනම සැපයෙනුයේ කාසි වල අන්තර්ගත වී ඇති සංකේත අධ්‍යයනයට භාජනය කිරීමෙනි. එ සේ ම කාසිවල ප්‍රමාණය හා බර පිළිබඳ ව අධ්‍යයනයට භාජනය කෙරේ. මෙම සංචිතයේ අඩංගු බොහොමයක් කාසි දිගු කාලයක් සංසරණයේ යෙදී තිබීම හෝ දීර්ඝ කාලයක් විවිධ හේතුන් නිසා හායන කාරක වලට භාජනය වීම හේතුවෙන් කාසිවල අඩංගු ප්‍රතිමුඛ හා අභිමුඛ සංකේත බොහෝ සෙයින් ගෙවී යාමට ලක් වී තිබේ. කෙ සේ වෙතත් මෙම කාසි වල අඩංගු සංකේත පිළිබඳ ව විමසා ඒවා ගුප්තා සහ හර්දකාර් වර්ගීකරණයට ලක් කොට කාසි වල වර්ග හඳුනා ගැනීමට උත්සාහ කෙරේ.

## මීරිගම සංචිතයෙහි අඩංගු හස් එබූ කාසිවල වර්ග

මීරිගම සංචිතයෙහි කාසි 269ක් අඩංගු වේ. කාසි බොහොමයක ම සංකේත ගෙවී ගොස් ඇති අතර සංකේත තිබූ බවට සලකුණු පමණක් ඉතිරි වී තිබේ. සංචිතය තුළ ඇති කාසි වල සංකේත පිළිබඳ ව විමසීමේ දී පෙනී ගිය කරුණක් වූයේ කාසි වල නිශ්චිත වශයෙන් සටහන් වන අභිමුඛ සංකේත පහක් අන්තර්ගත වන බව ය. ඒ නම්,

01. සූර්ය සංකේතය :  / 

02. බාහු හයක් ඇති සංකේතය :  / 

03. මොල්ලිය සහිත ගවයා හෝ අලියා :



04. අවශේෂ සංකේත වලින් දෙකක් :



(අවශේෂ සංකේතවලින් කිහිපයක් පමණි)

මේ ආකාරයට අභිමුඛ සංකේත පහක් යෙදෙන කාසි මගධ අධිරාජ්‍ය කාලය දක්වා දිව යයි (Gupta and Hardakar 1985:01). මෙම සංකේත වලින් සූර්ය සංකේතය හා බාහු හයක් ඇති සංකේතය නිශ්චිතව ම සටහන් වන අතර අනෙකුත් සංකේත වෙනස් වෙමින් යෙදේ (Ibid). මීරිගම සංචිතය තුළ ද මෙම නිශ්චිත ව යෙදෙන සංකේත පහ හඳුනා ගත හැකි ය. එහි දී සූර්ය සංකේතය හා බාහු හයක් ඇති සංකේතය දෙක එක් ව යෙදෙන අතර අනෙකුත් සංකේත වෙනස් ව යෙදෙනු හඳුනාගත හැකි ය. මෙ ලෙස සංචිතය තුළ අන්තර්ගත වී ඇති නිශ්චිත ව යෙදෙන සංකේත පහ පිළිබඳ ව පරීක්ෂා කිරීමෙන් අනතුරුව කාසි කුමන වර්ගවලට අයත් දැයි සොයා බලන ලදී. ගුප්තා සහ හර්දකාර්ට අනුව කාසි වර්ග (coin types) 7ක් හඳුනා ගැනේ. එ නම්,

I වන වර්ගය - මෙම වර්ගයට අයත් වන්නා වූ කාසි විශාල මුහුණතකින් යුක්ත වේ. පැරණි ම කාසි විශේෂය වන මෙම කාසි පසු කාලීනව උණු කර නැවත කාසි නිපද වීමට ගෙන ඇත. එබැවින් මෙවැනි කාසි, සංචිතයකින් හමුවන්නේ ඉතා අඩු ප්‍රමාණයකි.

II වන වර්ගය - මෙම කාසි වර්ගය විරල වශයෙන් හමු වේ. එහි ප්‍රතිමුඛයෙහි III වන හා IV වන වර්ගය නැවත සනිටුහන් කර ඇති අතර නැවත අච්චු ගැසීමකට ලක් කර තිබේ. එ ලෙස නැවත අච්චු ගැසීමකට ලක් නොවූ කාසි හමු වන්නේ ඉතා අඩුවෙනි. මෙම කාසි, III වන හා IV වන යන වර්ග ඇති සංචිත සමඟ හමු වේ.

III වන වර්ගය - මෙම වර්ගය තුළ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ එය II වන වර්ගයේ කාසි නැවත අච්චු ගසමින් III වන වර්ගය නිකුත් කළ නිසාත්, සූර්යා, අලියා, මොල්ලිය සහිත ගවයා නිශ්චිත සංකේත බවට පත් වන නිසාත් ය.

IV වන වර්ගය - මෙහි උප වර්ග 04 කි

IVa පර්වත සංකේතය යෙදේ

IVb පර්වත සංකේත හෝ බැංකුකරුවන්ගේ සංකේත අයත් නොවේ

IVc පර්වත සංකේතය ඇතුළත්ය. අනෙකුත් කුඩා සංකේත නැත.

IVd යහපත් නිමාවෙන් යුත් මෙම කාසි පර්වත සංකේත, බැංකුකරුවන්ගේ සංකේක හා අනෙකුත් කුඩා සංකේත යෙදේ.

V වන වර්ගය පර්වත සංකේතය හෝ පර්වත මත ඇති අඩසඳ සහිත සංකේතය යෙදේ. උප වර්ග 02කි.

Va කැපී පෙනෙන ප්‍රතිමුඛ සංකේත නැත.

Vb කැපී පෙනෙන ප්‍රතිමුඛ සංකේත ඇත.

VI වන වර්ගය - කුඩා ප්‍රමාණයේ කාසි වේ. බොහෝ සෙයින් විනාශ වී ගිය කාසි ය. උප වර්ග 02 කි.

VI a කැපී පෙනෙන ප්‍රතිමුඛ සංකේත නැත.

VI b කැපී පෙනෙන ප්‍රතිමුඛ සංකේත ඇත.

VII වන වර්ගය- කුඩා ප්‍රමාණයෙන් යුක්ත වන අතර මිනිස් රූප අන්තර්ගත වේ (Gupta and Hardakar 1985:8-9).

මේ අකාරයට විමසා බැලීමේ දී මීරිගම සංචිතය තුළ හස් එබූ කාසි වර්ග තුනක් ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකි ය. එ නම්,

1. I වන වර්ගය
2. III වන වර්ගය
3. IV a/ IV b / IV c/ IV d වන වර්ග යනුවෙනි.

I වන වර්ගයට අයත් කාසි ලෙස හඳුනාගත හැක්කේ කාසි දෙකක් පමණි. එය ලි.ප.අ 37.62.32.20 හා 37.62.32.26 යන කාසිය. III වන වර්ගයට කාසි 20ක් පමණ අන්තර්ගත වේ. උදාහරණ ලෙසට ලි.ප.අ. 37.62.32.32, 37.62.32.44 වැනි කාසි හඳුනාගත හැකි ය. IV වන වර්ගයේ උප වර්ග හතරටම අයත් කාසි වර්ග ශමු වේ. උදාහරණ ලෙසට IV a වර්ගයට අයත් කාසි ලෙස ලි.ප.අ. 37.62.32.32,

ලි.ප.අ. 37.62.32.92 වැනි කාසි ද IV b වර්ගයට උදාහරණ ලෙස ලි.ප.අ. 37.62.32.75, ලි.ප.අ. 37.62.32.243 යන කාසි ද IV c වර්ගයේ කාසි වලට උදාහරණ ලෙසට ලි.ප.අ. 37.62.32.264, යන කාසිය ද IV d වර්ගයට උදාහරණ ලෙසට ලි.ප.අ. 37.62.32.70, ලි.ප.අ. 37.62.32.51 වැනි කාසි ද හඳුනා ගත හැක.

## නිගමනය

සංචිතය තුළ හස් එබූ කාසි වර්ග තුනක් ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැක. එනම්

1. I වන වර්ගය
2. III වන වර්ගය
3. IV a/ IV b / IV c/ IV d වන වර්ගය

I වන වර්ගයට අයත් කාසි සංචිතය තුළ හඳුනාගත හැක්කේ කාසි දෙකක් පමණි. මෙය ගුප්තා සහ හර්දකාර් දැක් වූ ආකාරයට නැවත අච්චු ගැසීම නිසා හමුවන්නේ අවම වශයෙනි. මෙම වර්ග අනුව ඉන්දියාවේ මෙම කාසි විවිධ කාල පරිච්ඡේදයන්හි භාවිත වී තිබේ. I වන වර්ගය මෞර්ය යුගයට අයත්ය. ගුප්තා සහ හර්දකාර් එය ක්‍රි. පූ. 500 පවරා දේ(Gupta and Hardakar:1985:31). අනෙක් කාසි වර්ග ඊට පසු කාල පරිච්ඡේදයකට අයත් යයි අනුමාන කල හැකිය. මේ අනුව බලන කළ මීරිගම සංචිතය තුළ ප්‍රධාන වශයෙන් කාසි වර්ග 03ක් ඇතුළත් වන බවත් එම කාසි මෞර්ය යුගයට හා ඒ හා ආසන්න පසුකාලයට අයත් විය හැකි බවටත් උපකල්පනය කළ හැක.

## ආශ්‍රෙය ග්‍රන්ථ


තරංගනී කේ.ඩබ්.සි,(2010), ශ්‍රී ලංකාවේ මීරිගමින් හමු වූ හස් එබූ කාසි පිළිබඳ පුරාවිද්‍යා අධ්‍යයනයක්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අවසන් වසර උපාධි නිබන්ධනය (අප්‍රකාශිත)

සිරිසෝම එම්.එච්., ගීතා අමරසිංහ, වර්ෂය සඳහන්ව නැත, ශ්‍රී ලංකාවේ පුරාණ කාසි-1, හස් එබූ කහාපණ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.

Bhandarkar D.R. (1921), Lectures On Ancient Indian Numismatics; University Of Calcutta.

Brown, C.J. (1922), The Heritage of India Series the Coins of India. Calcutta: Association Press.

Codrington, H.W (1924), Ceylon Coins and Currrency, Ceylon: A.C.Richards,Acting government printers.

Cuningham R and Cathy Batt ( 1999),. Anuradhapura:The British –Sri Lankan Excavation at Anuradhapura Salgahawatta 2.Archaeopress,Oxford.

Gupta P.L and T.R.Hardakar (1985), Indian Silver Punch Marked coins-Magadha-Mauryan Karshapana Series; Indian Institute of Research in Numismatics, Nasik.

Wickramasinghe, S. (2010), Studuy of a Hoard of Punch Marked Coins Found at Mirigama( now Store in the Colombo Museum), Siri Nimal lakdusinghe Felicitation Volume , 415-428,Neptune Publication, Battaramulla.